# පුරාණ අම්පාර දිස්ත්‍රික්කය පිළිබඳව විමර්ශනයක් (අම්පාර දිස්ත්‍රික්කයේ ශිලාලේඛන ඇසුරෙන්)

Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

**ඒ. එම්. වික්‍රමාදර**
**නිලන්ති බණ්ඩාර**

**සංක්ෂේපය**

ජීවයේ සම්භවයෙන් පසුව සන්නිවේදනයේ සුදුසුම මාධ්‍ය ලෙස ලේඛන කලාව ආරම්භ විය. ඒ අනුව තමා සංජනනය කරන්නාවූ වැදගත් කාරණා ලේඛනය හරහා ඉදිරිපත් වූ අතර ඒ තුළ දේශපාලන, ආර්ථික, සමාජමය, ආගමික කාරණා අන්තර්ගත විය. ලේඛන මාධ්‍යයක් ලෙස ශිලාලේඛන රචනාව ශ්‍රී ලංකාව තුළ ක්‍රි.පූ. තුන්වන සියවස වනවිට ආරම්භවී ඇති අතර එම ආරම්භක අවධියේ පටන්ම රචනා වූ ශිලාලේඛන බහුල වශයෙන් හඳුනා ගැනීමට හැකියාව ලැබෙන ප්‍රදේශයක් ලෙස වර්තමාන අම්පාර දිස්ත්‍රික්කය දැක්විය හැකිවේ.

ශ්‍රී ලංකාවේ ලේඛන මාධ්‍යයන් අතර ශිලා මාධ්‍ය ඉතා ජනප්‍රිය හා බහුල වශයෙන් භාවිත වූ බව හඳුනාගත හැකිය. මෙම අධ්‍යයනයේ මූලික අරමුණ බවට පත්වන්නේ ශිලාලිපිවල අන්තර්ගත කරුණු තුළින් අතීතය පිළිබඳව හඳුනා ගැනීමයි. එහිදී අම්පාර දිස්ත්‍රික්කයට අදාළ ශිලාලේඛනවල සඳහන් දේශපාලන, ආර්ථික, සමාජයීය සහ ආගමික ආදී කරුණු වෙන් වෙන්ව හඳුනා ගෙන ඒ පිළිබඳව විචාරාත්මක අධ්‍යයනයක් මගින් ප්‍රදේශයේ තත්කාලීන සිදුවීම් හඳුනා ගැනීමට උත්සාහ කරතිබේ. එම කරුණු නැවත ලිඛිත මූලාශ්‍රගත කරුණු සමග ගැළපීම මගින් කරුණු තහවුරු කරගැනීම හා නව කරුණු කෙරෙහි විශේෂ අවධානයක් යොමු කිරීම තවත් අරමුණකි. ලිඛිත මූලාශ්‍රය මගින් මගහැරුණු කරුණු, සාධක සහිතව ශිලාලේඛන මගින් සනාථ කිරීමට ද හැකියාව ලැබී තිබේ. මේ සියලු සාධක රාශිගත කර ප්‍රදේශයේ ඉතිහාසය ගොඩනැගීමට හැකියාව ලැබේ. මේ නිබන්ධනය සඳහා තොරතුරු රැස් කරගැනීම සඳහා ප්‍රධාන ලෙස ප්‍රාථමික මූලාශ්‍රයන්ගේ සහාය ලැබී තිබේ. එසේම ශිලාලිපි එකතූන් හා ගවේෂණයෙන් ලත් තොරතුරු ඇතුළත් වී තිබේ.

මේ ඇසුරින් නිගමනය කළ හැක්කේ අම්පාර ප්‍රදේශය අගනුවරින් බැහැර ප්‍රත්‍යන්ත ප්‍රදේශයක් ලෙස සැලකුව ද දේශපාලනික, ආර්ථික, සමාජයීය, ආගමික යන අංශයන්ට අනුව ප්‍රදේශය දියුණු මට්ටමින් පැවති බවයි. විශේෂයෙන්ම අනුරාධපුර ආරම්භක අවධියේ පටන් ක්‍රි.ව. දසවන සියවස දක්වා අම්පාර ප්‍රදේශය ඉතාම හොඳ මට්ටමින් පවත්වාගෙන ගිය බවයි. එයින් අනතුරුව පොළොන්නරු හා සංක්‍රාන්තික අවධීන් මෙම ප්‍රදේශයට එතරම් සුබදායී කාලයක් ඇති නොකළ බව පෙනේ. එසේම ප්‍රදේශයට කිසියම් ආලෝකයක් ලැබෙන්නේ ක්‍රි,ව. දහහතරවන සියවසේදී ය. එසේ වීමට ශ්‍රී ලංකාවට එල්ලවූ ආක්‍රමණික තත්ත්වයන් ආදිය හේතු වන්නට ඇත. ඒ කරුණු අධ්‍යයනය කිරීමට සිදුවන්නේ ලිඛිත මූලාශ්‍රය මගිනි. මන්ද පසුකාලයේ ශිලාලේඛන ඉතාමත්ම සුළු වශයෙන් ලැබීම නිසාවෙනි.

**ප්‍රමුඛ පද : *අම්පාර දිස්ත්‍රික්කය අනුරාධපුර යුගය ශිලාලේඛන ලිඛිත මූලාශ්‍ර සංස්කෘතික පසුබිම***

1 ama1991.mi@gmail.com පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

2 nilu@kln.ac.lk ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය